# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,873/2 — 1969 සැප්තැම්බර් 28 වැනි ඉරිදා — 1969.9.28**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**

# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)**

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 27/39.

### ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, මෙම නිවේදනයෙන්, කළුතර දිස්ත්‍රික්කයේ දෙඩන්ගොඩ ගම් ප්‍රදේශයේ පිහිටි දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම සම්බන්ධයෙන් 1969 ජූලි මස 25 දින හා අංක 14,863/6 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනය, එහි උපලේඛනයේ II තීරුවේ සඳහන් අංක 2 හා 10 දරණ ඡන්ද කොට්ඨාශ විස්තර වෙනුවට මෙහි උපලේඛනයේ සඳහන් විස්තර ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

*1969 සැප්තැම්බර් මස 28 වැනි දින කොළඹ දීය.*

### උපලේඛනය

**අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—ඇලදූව**

ඇලදූව, ගල්පොත්තවල යන ගම් හා ඇඹලව් වත්ත, අන්නාසිගල වත්ත (කොටස) ආඩියාකන්ද වත්ත හා ඇලදූව වත්ත යන වතුවලින් සමන්විතය.

**අංක 10 දරන ඡන්ද කොට්ඨාශය—තුඩුගල**

තුඩුගල ගමින් හා හටන්ගල්ල වත්ත, ලක්ෂ්මී වත්ත සහ (තුඩුගල වතුයායේ) තුඩුගල ඩිවිෂන් යන වතුවලින් සමන්විතය.

9–250/1

---

ඇල්. ඩී.—බී. 27/39.

### ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමති රණසිංහ ප්‍රේමදාස වන මම, මෙම නිවේදනයෙන්, කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරළේ එගොඩපතපත්තු ගම් ප්‍රදේශයේ ඡන්ද කොට්ඨාශ නැවත බෙදීම සම්බන්ධයෙන් 1969 ජූලි මස 22 වැනි දින හා අංක 14,863/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය—

(අ) එහි සඳහන් (ඈ) අනුච්ඡේදය කපා හැරීමෙන් ; සහ

(ආ) එහි (ඇ) දරන අනුච්ඡේදය (ඈ) දරන අනුච්ඡේදය වශයෙන් නැවත යෙදීමෙන් සංශෝධනය කරමි.

1969 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

9–250/2

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි

1 A —ජේ 6862—5,250 (69/9)